# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களம்
DEPARTMENT OF IMMIGRATION & EMIGRATION

"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சுஹுருபாயா", ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை, இலங்கை.
"Suhurupaya", Sri Subhuthipura Road, Battaramulla, Sri Lanka.
E-mail: controller@immigration.gov.lk

SRI LANKA IMMIGRATION AND EMIGRATION

මගේ අංකය :
எனது இல :
My No. : MD/U/ 24/ 10

ඔබේ අංකය:
உமது இல :
Your No. :

දිනය :
திகதி :
Date : 26/08/2024

**මාධ්‍ය නිවේදනය**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුව මේ වනවිට ඇති හිස් විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණය සීමිත වීම හේතුවෙන් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරිම සීමා කිරීමට සිදුව ඇත. නව ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර හඳුන්වා දීමට රජය විසින් පියවර ගෙන ඇති අතර, ඒ සඳහා ජාත්‍යන්තර මිල ගණන් කැඳවීම මගින් විදේශීය සමාගමකට විදේශ ගමන් බලපත්‍ර සැපයීම සඳහා ටෙන්ඩරයක් දැනටමත් ප්‍රදානය කර ඇත.

එසේ වුවද, දැනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතු හිස් විදේශ ගමන් බලපත්‍ර තොග සීමිත වීම සැලකිල්ලට ගෙන ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර ඇණවුම් කළ සමාගමෙන්ම එම ඇණවුමෙහිම කොටසක් වශයෙන් සාමාන්‍ය හිස් විදේශ ගමන් බලපත්‍ර 750,000 ක් සපයා ගැනීමට කටයුතු කර ඇත. මෙම විදේශ ගමන් බලපත්‍ර තොගය ඔක්තෝබර් මස අවසානයේ හෝ ඊට පෙර දිවයිනට ලඟා වීමට නියමිතය.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව පසුගිය වසරේ නිකුත් කර ඇති විදේශ ගමන් බලපත්‍ර සංඛ්‍යාවෙන්, විදේශ ගත වී ඇති විදේශ ගමන් බලපත්‍රලාභීන් සංඛ්‍යාව 23% ක ප්‍රමාණයකි. එබැවින් උක්ත හිස් විදේශ ගමන් බලපත්‍ර තොගය සපයා ගන්නා තෙක්, අත්‍යවශ්‍යම හේතුවක් මත පමණක් විදේශ ගමන් බලපත්‍ර සඳහා අයදුම් කරන මෙන් මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරිමේදී සිදුවන ප්‍රමාදය නිසා මහජනතාවට සිදුවන අපහසුතාවය සම්බන්ධයෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව කණගාටුව පළ කර සිටී.

හර්ෂ ඉළුක්පිටිය
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

දුරකථන / தொலைபேசி / Telephone

ක්ෂණික ඇමතුම් / உடன் அழைப்பு / Hotline: 1962
පොදු / பொது / General: (+94) 11-5329000
ෆැක්ස් / பக்ஸ் / Fax: (+94) 11-2885358

දුරකථන / தொலைபேசி / Telephone

ක්ෂණික ඇමතුම් / உடன் அழைப்பு / Hotline: 1962

පොදු / பொது / General: (+94) 11-5329000

ෆැක්ස් / பக்ஸ் / Fax: (+94) 11-2885358